සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018
# පුරවැසි අධ්‍යාපනය

**09 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකය: |
|---|

## I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1- 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියා දක්වන්න.

01. ශ්‍රී ලංකාවේ සමථකරණය සඳහා ............................................................... මඟින් සමථමණ්ඩල පිහිටුවා ඇත.

(රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය / අධ්‍යාපන අමාත්‍යාංශය / අධිකරණ අමාත්‍යාංශය)

02. උපදෙස් හා මඟපෙන්වීම් ලබාදෙමින් ගැටලු විසඳීමේ ක්‍රමය ............................................ යනුවෙන් හඳුන්වයි.

(විනිසීම / උපදේශනය / සාකච්ඡා ක්‍රමය)

03. ගැටුම් අවස්ථාවකදී භෞතික සම්පත්, මානව සම්පත් හා ................................. ද විශාල වශයෙන් නාස්ති වේ.

(කාලය / මුදල් / ශක්තිය)

04. රැකියාවකට අයදුම් කිරීමේ දී නම, ගම, වයස සඳහන් කිරීම ...................................................... වලට අයත්වේ.

(පෞද්ගලික තොරතුරු / පෞද්ගලික ගුණාංග / පෞද්ගලික කුසලතා)

05. තැනිත්තැන සංචාරය කරමින් භාණ්ඩ අලෙවි කිරීම ................................................ රැකියා ලෙස අර්ථ දක්වයි.

(ස්ථිර / ජංගම / ගෘහස්ථ)

- අංක 06 - 10 දක්වා ප්‍රශ්නවල ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06. අ.පො.ස. උ.පෙළ සමත්වීම හා උපාධිය සමත්වීම ගුරුවෘත්තිය සඳහා ශාස්ත්‍රීය සුදුසුකමක් නොවේ. (..........)

07. ඉල්ලුම් පත්‍රයේ සියලුම තොරතුරු පිරවීම ඉල්ලුම් පත්‍ර පිරවීමේදී සැලකිලිමත් විය යුතු නැත. (..........)

08. සම්මුඛ පරීක්ෂයකට මුහුණ දීමට කුසලතා වර්ධනය කරගැනීම වැදගත්වේ. (..........)

09. සියලුම සම්පත් උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීම කාර්යක්ෂමතාව ලෙස හඳුන්වයි. (..........)

10. රැකියාවක් ලබාගත්පසු කුසලතාවර්ධනය කර ගැනීම අවශ්‍ය නොවේ. (..........)

- අංක 11 - 15 දක්වා රූප සටහන් ආශ්‍රයෙන් හිස්තැන් පුරවන්න.



11. සම්මුඛ පරීක්ෂණ ක්‍රම අතුරින් මෙම ක්‍රමය .............................. විසින් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ ක්‍රමයකි.

12. ඉහළ වෘත්තීය මට්ටමේ රැකියා සඳහා තෝරා ගැනීමේදී පුද්ගලයන් ............................................ දෙනෙකු පමණ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සිටියි.

13. පින්තූරයේ දැක්වෙන පරිදි කරන රැකියා ............................................... රැකියා ගණයට අයත්වේ.



14. මාර්ග සකස්කිරීම වැනි රැකියා ............................................... කරණු ලබන රැකියාගණයට අයත් වේ.

15. මෙම රූපයෙහි දැක්වෙන්නේ අතීතයේ වෘත්තීය පුහුණුව පියාගෙන් ............................................... ට ලබාදෙන අවස්ථාවකි.



- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න හොඳින් කියවා දී ඇති වරණ හතරෙන් වඩාත් නිවැරදි වරණය තෝරා යටින් ඉරක් අඳින්න.**

16. අපරාධ නීතිය යටතේ දඬුවම් ලබාදෙන වරදක් ලෙස සලකන්නේ මින් කුමක් ද?

    (1) ළමා අපයෝජනය (2) පවුල් ආරවුල්

    (3) උරුමයන් පිළිබඳ ගැටලු (4) අයිතිවාසිකම් කඩවීම්

17. ආරවුලක් සමථ මණ්ඩලය වෙත යොමුකළ හැකි ආයතනයක් වන්නේ මින් කුමක් ද?

    (1) පන්සල (2) පවුල

    (3) පොලීසිය (4) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

18. එක් දේශපාලන පක්ෂයක් පමණක් ක්‍රියාත්මක වන රටක් ලෙස සැලකෙන්නේ,

    (1) ඇමරිකාව (2) කියුබාව (3) ශ්‍රී ලංකාව (4) ඉන්දියාව

19. ශ්‍රී ලංකාවේ දකුණු පළාතට අයත් දිස්ත්‍රික්ක සංඛ්‍යාව කොපමණ ද?

    (1) තුනකි. (2) දෙකකි. (3) හතරකි. (4) පහකි.

20. සම්මුඛ පරීක්ෂණයට සහභාගි වන පුද්ගලයෙකුගේ පෞද්ගලික පෙනුම මැන බලන අංගයක් වන්නේ මින් කුමක් ද?

    (1) ඉඳගැනීම (2) ඇඳුම් පැළඳුම් (3) අත්වලන (4) මුහුනෙන් පෙන්වන හැඟීම්

## <u>II කොටස</u>

- **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය සඳහා එක් කොටසකට ලකුණු 02 බැගින් ලකුණු 16 ක් හිමිවේ.**

01. (i) සමාජ ආයතන හා පාසල හැර සමාජ සුරක්ෂිතතාවය කෙරෙහි දායක වන ආයතන දෙකක් සඳහන් කරන්න.

    (ii) ආගමික ආයතනයක් මඟින් ඔබේ ජීවිතය යහපත් කිරීමට ගන්නා ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

    (iii) දේශීය නීතිය කොටස් තුනකට බෙදේ. ඉන් දෙකක් නම් කරන්න.

    (iv) අධිකරණයේ ගෞරවය ආරක්ෂාකිරීම සම්බන්ධයෙන් පුද්ගලයෙකු සතු යුතුකම් දෙකක් සඳහන් කරන්න.

    (v) නිෂ්පාදන විවිධාංගීකරණය යටතේ තේ නිෂ්පාදනය විවිධාංගීකරණය වී ඇති ආකාරයට නිදසුන් දෙකක් සඳහන් කරන්න.

    (vi) අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුවට යොදා ගැනෙන තාක්ෂණික උපකරණ දෙකක් සඳහන් කරන්න.

    (vii) පළාත් පාලන ආයතනයක ප්‍රධානියා සතු බල තල දෙකක් සඳහන් කරන්න.

    (viii) ගැටුම් නිරාකරණය කිරීමේදී ඔබ විසින් පුරුදු පුහුණු කළයුතු ගුණාංග දෙකක් සඳහන් කරන්න.

(2 × 8 = 16)

02\. (i) ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය දක්වන ආකාරයට ගැටුමක් යනු කුමක් ද? හඳුන්වන්න. (ල.02)

(ii) පහත A, B, C යටතේ අසා ඇති ප්‍රශ්නවලට අදාල පිළිතුරු අනුපිළිවෙලින් සඳහන් කරන්න.

(A) ගැටුම් නිරාකරණය කිරීමේදී ''ජය ජය'' විසඳුම කරා ඉතා පහසුවෙන් ළඟා වියහැකි ගැටුම් නිරාකරණය කරගැනීමේ සරළම ක්‍රමය කුමක් ද?

(B) විවිධාකාරයෙන් පහසුකම් සපයා, උපදෙස් හා මඟපෙන්වීම, ලබාදෙමින් ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රමය හඳුන්වන්නේ කුමන නමින් ද?

(C) ''විකල්ප ජනනය නොකිරීම'' කුමන අවස්ථාවකදී ඇතිවිය හැකි බාධකයක් ද? (ල.03)

(iii) පහත දැක්වෙන රුක් සටහනේ ලෝකයේ දක්නට ලැබෙන ගැටුම් වලට අදාල නිදසුන් යොදා සම්පූර්ණ කරන්න. (ල.06)

දේශපාලන මූලමත ඇතිවන ගැටුම් — • ......................................

ආර්ථික මූලමත ඇතිවන ගැටුම් — • ......................................
• ......................................
• ......................................

සමාජ මූලමත ඇතිවන ගැටුම් — • ......................................
• ......................................

03\. (i) අනාගතයේ රැකියා අපේක්ෂාවෙන් සිටින ඔබ පෞද්ගලික ගොනුවක් පවත්වාගෙන යාමේදී තොරතුරු ගොනුගතකරන ආකාරය පහත දී ඇති තොරතුරුවලින් තෝරාගෙන වගුවේ සටහන් කරන්න. (ල.06)

නම, කැපවීම, සමාජශීලී බව, උපන්දිනය, කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම, සුහදබව

| පෞද්ගලික තොරතුරු | පෞද්ගලික චර්යා | පෞද්ගලික ගුණාංග |
|---|---|---|
| 1. ................................................ | 1. ................................................ | 1. ................................................ |
| 2. ................................................ | 2. ................................................ | 2. ................................................ |

(ii) පහත සඳහන් රැකියා අතුරෙන් ස්වයං රැකියා, සේවාදායක රැකියා හා ස්වෙච්ඡාවෙන් කරන රැකියා එක බැගින් සඳහන් කරන්න. (ල.03)
(කුලී රථ සේවය, ගුරුවෘත්තිය, ඇඳුම් මැසීම, දහම් පාසල් ගුරුවරුන්, කළමනාකාර සහකරුවන්)

(iii) අ.පො.ස (සා/පෙළ) විභාගය සමත්වී උසස් පෙළ හැදෑරීමේදී තෝරාගනු ලබන විෂය ධාරාවන් දෙකක් සඳහන් කරන්න. (ල.02)

04\. (i) අනාගත ජීවන වෘත්තිය සඳහා ගුරුවෘත්තිය තෝරා ගන්නෙකු විසින් සපුරාගත යුතු ශාස්ත්‍රීය සුදුසුකම් දෙකක් හා වෘත්තීය සුදුසුකම් දෙකක් සඳහන් කරන්න. (ල.04)

(ii) ඔබ අ.පො.ස. උ.පෙළ සඳහා වාණිජ විෂය ධාරාව තෝරා ගන්නේ නම් එම විෂය ධාරාවට පවතින රැකියා තුනක් සඳහන් කරන්න. (ල.03)

(iii) අ.පො.ස. සා.පෙළ විභාගයෙන් පසු පාඨමාලාවක් තෝරා ගන්නේ නම් ඒ සඳහා යොමු විය යුතු ආයතන දෙකක් හා පාඨමාලා දෙකක් සඳහන් කරන්න. (ල.04)



05\. (i) මැතිවරණයකදී මෙම රූපයෙන් නිරූපනය වන අවස්ථාව සඳහන් කරන්න. (ල.02)

(ii) මැතිවරණයකදී ඡන්ද දායකයෙකු සතු යුතුකම් තුනක් සඳහන් කරන්න. (ල.03)

(iii) (අ) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටවල් තුනක් නම් කරන්න. (ල.03)

(ආ) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන මැතිවරණ 3 ක් සඳහන් කරන්න. (ල.03)

06. (i) පහත සඳහන් වගන්ති සැලකිල්ලට ගෙන ණය කාඩ්පත් භාවිතයේ වාසි අවාසි සඳහන් කරන්න. (ල.06)

(මුදල් එහාමෙහා ගෙනයාමේ පහසුව, ක්ෂණිකව කොන්දේසි වෙනස් කිරීම, ඉහළ පොළී අනුපාත අයකිරීම, නියමිත වේලාවට බිල්පත් ගෙවීමට හැකිවීම, ක්ෂණික අවශ්‍යතා සඳහා ණය ලබා ගැනීමට හැකිවීම, ඉහළ වාර්ෂික ගාස්තු අය කිරීම.)

| ණයකාඩ්පත් භාවිතයේ වාසි | ණයකාඩ්පත් භාවිතයේ අවාසි |
|---|---|
| 1. ............................................................ | 1. ............................................................ |
| 2. ............................................................ | 2. ............................................................ |
| 3. ............................................................ | 3. ............................................................ |

(ii) පෞද්ගල මූල්‍ය කලමනාකරණයේදී ඔබේ පවුලට ආදායම් ලැබෙන ක්‍රම දෙකක් හා වියදම් වන ක්‍රම තුනක් සඳහන් කරන්න. (ල.05)

පෞද්ගලික මූල්‍ය කළමනාකරණය

ආදායම්
1. ..............................
2. ..............................

වියදම්
1. ..............................
2. ..............................
3. ..............................

07. (i) දී ඇති උපකාරක පද උපයෝගී කරගෙන පහත දක්වෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න. (ල.07)




<u>පහලට -</u>

1. කාර්යාලයක ලිපිගොනුවල වැඩකරන අය මේ නමින් හැඳින්වේ.
2. විද්‍යා විෂයධාරාව හැදෑරීමෙන් කාන්තාවන්ට රෝහලක සේවය කළ හැකි වෘත්තියකි.
3. වාණිජ විෂය ධාරාව හැදෑරීමෙන් ලබා ගත හැකි වෘත්තියකි.

<u>හරහට -</u>

4. සේවාදායක රැකියාවකි.
5. දත් හඳුන්වන නමකි.
6. වැඩකරන අය හඳුන්වන නමකි.
7. ඕනෑම ආයතනයකට අත්‍යවශ්‍ය වෘත්තිකයෙකි.

(ii) ඕනෑම රැකියාවක් සාර්ථකත්වයට පත්කර ගැනීම සඳහා ඔබ තුළ වර්ධනය කරගතයුතු ගුණාංග දෙකක් සඳහන් කරන්න. (ල.02)

(iii) ඔබට ලැබෙන රැකියාව මැනවින් ඉටුකිරීමේදී කාල කලමනාකරණය සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ල.02)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **තෙවන වාර පරීක්ෂණය 2018**

**09 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය**

## I කොටස

01. අධිකරණ අමාත්‍යාංශය 02. උපදේශනය 03. කාලය 04. පෞද්ගලික තොරතුරු
05. ජංගම 06. × 07. × 08. ✓ 09. ✓ 10. × 11. තනි පුද්ගලයෙකු
12. 5 13. ගෘහස්ත 14. එළිමහනේ 15. පුතාට 16. 1 17. 3 18. 2
19. 1 20. 2 (2 x 20 = 40)

## II කොටස

01. (i) පවුල, ආගමික ආයතන
(ii) විනය හා ශික්ෂණය ඇති කිරීම, අධ්‍යාත්මික සංවර්ධනය, යහපත් ආකල්ප සංවර්ධනය..... යනාදී ගැලපෙන පිළිතුරු
(iii) අපරාධ නීතිය, සිවිල් නීතිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය
(iv) අධිකරණයට ගරු කිරීම, අපහාස ක්‍රියාවලින් වැලකීම, විනිසකරුවන්ට ගරු කිරීම
(v) ක්ෂණික තේ, පෙට්ටිවල ඇසුරුම් කළ තේ, හරිත තේ, කළු තේ
(vi) උඩිස් ප්‍රක්ෂේපන, බහුමාධ්‍ය ප්‍රක්ෂේපන
(vii) සභාව කැඳවීම, කල්තැබීම, මුලසුන දැරීම, මහජන උපයෝගීතා සේවා සැපයීම
(viii) ඉවසීම, සක්‍රීය සවන් දීම, කාරුණික බව (2 x 8 = 16)

02. (i) ප්‍රචණ්ඩ හැප්පීමක්, අරගලයක් හෝ හරඹයක් මානසික වශයෙන් සිදුවන අරගලයක් (ල.02)
(ii) A - සාකච්ඡා ක්‍රමය B - උපදේශනය C - ගැටුම් නිරාකරණයේ දී (ල.03)
(iii) • දේශපාලන මූලමත - දේශ සීමා අරගල
• ආර්ථික මූලමත - සම්පත් ලබාගැනීම, දිළිඳුකම, වෙළඳපල අත්පත් කර ගැනීම
• සමාජ මූලමත - පුද්ගලයින් අතර, ජන කණ්ඩායම් අතර (ල.06)

03. (i) • පෞද්ගලික තොරතුරු - 1. නම 2. උපන් දිනය
• පෞද්ගලික ගුණාංග - 1. සුහද බව 2. කැපවීම
• පෞද්ගලික චර්යා - 1. සමාජශීලීබව 2. කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ හැකියාව
(ii) • ස්වයං රැකියා - කුලී රථ සේවය, ඇඳුම් මැසීම
• සේවාදායක රැකියා - ගුරුවරුන්, කළමනාකාර සහයකවරුන්
• ස්වේච්ඡාවෙන් කරන රැකියා - දහම් පාසල් ගුරුවරු (ල. 03)
(iii) විද්‍යා, ගණිත, තාක්ෂණ, වාණිජ, කලා (ල. 02)

04. (i) • ශාස්ත්‍රීය සුදුසුකම් :- අ.පො.ස. උ.පෙළ සමත්වීම, උපාධිය සමත්වීම
• වෘත්තීය සුදුසුකම් :- ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා, ගුරු විද්‍යාල පුහුණු, පශ්චාත් උපාධි ඩිප්ලෝමා
(ii) කළමනාකරු, ගණකාධිකාරි, ගිණුම් ලිපිකරු, පරිපාලන සේවක, තක්සේරු කරු, ගුරුවෘත්තිය
(iii) • ආයතන - කාර්මික විද්‍යාලය, වෘත්තිය පුහුණු අධිකාරිය, ජාතික තරුණසේවා සභාව
• පාඨමාලා - මෝටර් රථ අලුත්වැඩියා, පරිගණක පුහුණුව, රූපලාවන්‍ය, හෙද පුහුණුව

05. (i) ඡන්දය ප්‍රකාශ කරන අවස්ථාවක් (ල. 02)
(ii) කැමති අයුරින් ඡන්දය ප්‍රකාශ කිරීම, ප්‍රචණ්ඩ ක්‍රියාවලින් වැලකීම, හොර ඡන්ද නොදැමීම යනාදී..... (ල. 03)
(iii) (අ) ශ්‍රී ලංකාව, ඉන්දියාව, ජපානය, ප්‍රංශය..... 72 පිටුව (ල. 03)
(ආ) ජනාධිපතිවරණය, මහා මැතිවරණය, පළාත් සභා මැතිවරණය, පළාත් පාලන මැතිවරණය (ල.03)

06. (i) • වාසි :- මුදල් එහා මෙහා ගෙන යාමේ පහසුව, නියමිත වේලාවට බිල්පත් ගෙවීමට හැකිවීම, ක්ෂණික අවශ්‍යතා සඳහා ණය ලබා ගැනීමට හැකි වීම
• අවාසි :- ක්ෂණික කොන්දේසි වෙනස් කිරීම, ඉහළ පොලී අනුපාත අයකිරීම, ඉහළ වාර්ෂික ගාස්තු අයකිරීම (ල.06)
(ii) • ආදායම් - වැටුප්, පොල් විකිණීමෙන්, රෙදි මැසීමෙන් ආදී ....
• වියදම් - ආහාර සඳහා, ඇඳුම් සඳහා, අධ්‍යාපනය සඳහා (ල. 05)

07. (i) <u>පහළට</u>
1. ලිපිකරුවන් 2. හෙදියන් 3. තක්සේරුකරු
<u>හරහට</u>
4. ගුරුවරුන් 5. දන්ත 6. සේවක 7. කම්කරු (ල. 07)
(ii) කැපවීම, වෙලාවට වැඩ කිරීම, කාර්යක්ෂම භාවය, කම්මැලි නොවීම, එකමුතුකම...... යනාදී ගැලපෙන පිළිතුරට ලකුණු දෙන්න. (ල. 02)
(iii) දෛනික කාලසටහනක් අනුගමනය කිරීම, කාර්යයන් සඳහා කාලයක් තීරණය කිරීම, රාජකාරි වැඩ ප්‍රමුඛතාවය අනුව පෙළ ගස්වා ගැනීම යනාදී ගැලපෙන පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (ල. 02)